**පේරාදෙණිය විශ්වවිද්‍යාලය - 2019**
**-----------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය
**----------------------------**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**-----------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

--------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | විශ්වවිද්‍යාලය ප්‍රාග්ධන ව්‍යාපෘති සහ පුනරුත්තාපන ව්‍යාපෘති සඳහා ලද ප්‍රතිපාදන මුදල ඉක්මවා වියදම් කිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ (Unspent Capital Grant) රු.277,256,481 ක හර ශේෂ සහ වියදම් නොකළ ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපන ව්‍යාපෘති ගිණුමේ රු.122,341,334 ක හර ශේෂ පැවතුණි. | මෙම හර ශේෂයන් තුළ රු.211,344,909 ක උපචිත මුදල් ඇතුළත් වේ. එසේම කඩිනමින් සිදුවන ව්‍යාපෘතීන් සඳහා ප්‍රමාදයන් සිදුවන ව්‍යාපෘතිවලින් මුදල් උපයෝගීකර ගෙවීම් සිදු කරනු ලැබේ. තවද භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මතද මෙම තත්ත්වය උදාවී ඇත. | ප්‍රාග්ධන සහ පුනරුත්තාපන ව්‍යාපෘතිවලට අදාළ ප්‍රතිපාදිත සීමාව තුළ වියදම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 සහ 2019 වර්ෂයන්හි ව්‍යවස්ථාපිත වාර්තාවන්හි දක්වා තිබූ සටහන්වලට අනුව වර්ෂ අවසානයට ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්හි රු.226,507,866 ක නොසැසඳීම් නිරීක්ෂණය විය. | මෙම නොසැසඳීම් ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 21 ඡේදය ප්‍රකාරව පිළියෙල කර ඇති ව්‍යවස්ථාපිත වාර්තාවේ වන අතර එමඟින් මූල්‍ය ප්‍රකාශනවලට කිසිදු බලපෑමක් ඇති නොකෙරේ. | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන සියලු තොරතුරු නිවැරදි තොරතුරු විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුස්තකාල පොත් හා සඟරාවල ක්ෂයවීම් රු.31,466,128 ක් වැඩිපුර දක්වා තිබුණි. | 2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සියලු වටිනාකම් නිවැරදි බවට තහවුරු විය යුතුය. |
| (ඈ) | විශ්වවිද්‍යාලය වෙත 2018 හා 2019 වර්ෂවල ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,165,933 ක ණය ශේෂයන් පවරා ගැනීමට මාස 03 සිට මාස 20 දක්වා කාලයක් ප්‍රමාදවී තිබුණි. | සේවකයන්ගෙන් මාසිකව අය කරනු ලබන ණය වාරික උපයෝජනය කරමින් නව ණය නිකුත් කිරීම හා මාරුවී පැමිණෙන නිලධාරීන්ගේ ණය පවරා ගැනීමට සිදුවීම මෙයට හේතුවී ඇත. ඉදිරියේදී මාස 03 ක්වත් කාලයක් තුළ ණය පවරා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තර | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය පීඨයේ ලිපිනය යටතේ අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයන් විසින් පීඨයේ පශු වෛද්‍ය රෝහල සංවර්ධනය කිරීම වෙනුවෙන් ලෙස සඳහන් කරමින් 2014 ජූනි 06 දින ලංකා බැංකුවේ පේරාදෙණිය ශාඛාවේ ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කර 2019 ජූනි 04 දින වන විට රු.2,606,324 ක මුදලක් රැස්කර තිබූ අතර ඉන් රු.2,065,613 ක මුදලක් ආපසු ලබාගෙන තිබුණි. පීඨයේ ඔසුසල බාහිර පාර්ශවයන් වෙත ලබා දීමෙන් මාසයකට රු.15,000 ක මුදලක් අවිධිමත් ලෙස ලබා ගෙන තිබුණ ද ඉතිරි මුදල් ලැබීම් ප්‍රභවයන් හා වියදම් කිරීම්වලට අදාළ තොරතුරු ලබාගත නොහැකි විය. | මෙම ඉතිරිකිරීමේ ගිණුම මේ වන විට තාවකාලිකව අත්හිටුවා ඇති අතර මෙම සිදුවීම්වලට අදාළව මුදල් රෙගුලාසි ප්‍රකාරව විමර්ශනයක් සිදුකර අවසන්ව ඇති අතර එම වාර්තාව 2020 ජූලි මස පැවැත්වෙන පාලක සභාවට ඉදිරිපත් කිරීමට නියමිතය. ඒ අනුව මෙම සිද්ධියට සම්බන්ධ අයට එරෙහිව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. | මෙවැනි තත්ත්වයන් නැවත ඇතිවීම වැළැක්වීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමය වැඩි දියුණු කිරීම හා විමර්ශන වාර්තාවට අනුව කඩිනමින් පියවර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | රු. | | | |
| විශ්වවිද්‍යාලයට අයත් රජයේ නිවාසවලින් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු නිවාස කුලී, ජල හා විදුලි ගාස්තු | 1,388,803 | මූල්‍ය ප්‍රකාශන සමඟ කාල විශ්ලේෂණයන් | රටේ පැවති අයහපත් තත්ත්වය මත අදාළ කාල විශ්ලේෂණයන් ඉදිරිපත් කිරීමට ප්‍රමාද විය. | මූල්‍ය ප්‍රකාශන සමඟ අදාළ කාල විශ්ලේෂණයන් ඉදිරිපත් කළ යුතුය. |

**1.6** **ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිවිසුම් කඩ කර වසර 15 ත් 30 ත් අතර කාලයක් ගතවී තිබූ ආචාර්යවරුන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.4,256,435 ක මුදලක් සහ දැනට සේවයේ යෙදී සිටින 2012 වර්ෂයේදී ගිවිසුම් කඩ කළ ආචාර්යවරයෙකුගෙන් අයවිය යුතු රු.6,120,858 ක මුදලක් 2020 ජුනි මාසය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ආචාර්යවරුන් 08 දෙනා ඉතා පැරණි බැඳුම්කර කඩකළ අයවලුන් වන අතර මෙම පුද්ගලයන් සම්බන්ධයෙන් නිකුත් කර ඇති අභ්‍යන්තර විගණන විමසුම් හේතුකොට ගෙන අර්ථසාධක අරමුදල් අයකර ගැනීම ප්‍රමාද වී ඇත. දැනට සේවයේ යෙදී සිටින නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල කොටස් වශයෙන් අයකර ගැනීම සඳහා පාලක සභාව වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලය පර්යේෂණ හා අනෙකුත් අරමුදල් මගින් නිකුත් කර තිබූ එකතුව රු.206,488 ක් වූ අත්තිකාරම් 09 ක්, වසර 20 සිට වසර 29 දක්වා කාලයක් ගත වී ඇතත්, අයකිරීමට කටයුතු කර නොතිබුණි. | පර්යේෂණ හා අරමුදල් අත්තිකාරම් ලබාදී ඇති ආචාර්යවරුන් විශ්වවිද්‍යාල සේවයෙන් ඉවත්ව ගොස් ඇති අතර එම අයගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී මෙම මුදල් අයකර ගැනීමට නියමිතව ඇත. | හිඟ අත්තිකාරම් මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබිය යුතු රු.400,000 ක මුදලක් වසර 07 කට අධික කාලයක් ගතවී ඇතත්, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2007 ඔක්තෝබර් 25 දින ගිනි ගැනීමට ලක් වූ අංක CPNA-2613 වෑන් රථයට ලැබිය යුතු මෙම මුදල ලබා ගැනීම සඳහා පාලක සභාවේ අනුමැතිය මත අදාළ නඩු භාණ්ඩ සමාගමට බාරදී මෙම රක්ෂණ මුදල ලබා ගැනීමට නියමිතව ඇත. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | විශ්වවිද්‍යාලයේ පීඨ 09 කින් 1980 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ අයවිය යුතු රු.5,334,341 ක ශාලා ගාස්තු හා දඩ මුදල් වසර 2 සිට වසර 37 ක කාලයක් ගත වී ඇතත්, අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම මුදල්වලින් 2020 ජුනි 17 දින වන විට ශාලා ගාස්තු රු.43,875 ක් හා දඩ මුදල් රු.115,045 ක් අයකරගෙන ඇත. මෙම හිඟ මුදල් අයකර ගැනීම සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව විසින් ගනු ලබන නිර්දේශ මත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | ශාලා ගාස්තු හා දඩ මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ඉ) | විශ්වවිද්‍යාලයේ සේවය කරන ලද නිලධාරීන් 16 දෙනෙකුගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.1,599,326 ක ණය ශේෂයන් විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම, සේවයෙන් ඉල්ලා අස්වීම හා විනය පරීක්ෂණ පැවැත්වීම යන කරුණු මත සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය නොවී පැවතුණි. | මෙම නිලධාරීන්ගේ අර්ථසාධක අරමුදල් මේ වන විට නිදහස් කර නොමැති බැවින් ඉදිරියේදී එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 387 | චෙක්පත් මඟින් කරන සියලුම ගෙවීම් සඳහා තම බැංකු ශේෂ ප්‍රමාණවත්දැයි ගෙවන නිලධාරියා නිරන්තරයෙන් සොයා බැලිය යුතු වුවත්, රජයේ බැංකුවක පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක 2019 පෙබරවාරි 28 දිනට රු.294,798 ක අයිරා ශේෂයක් පැවතුණි. | 2019 පෙබරවාරි 28 දිනට මුදල් පොත් රු.294,798 ක අයිරා ශේෂයන් පෙන්වුවද, බැංකු ගිණුමේ බැර ශේෂයන් පවතී. ඉදිරියේදී ගෙවීම් කිරීමේදී මුදල් ශේෂය අනුව ගෙවීම් කිරීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 396 | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ බැංකු ගිණුම් 05 ක රු.759,806 ක් වටිනා චෙක්පත් 60 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන තිබුණි. | ඉදිරියේදී වලංගු කාලය ඉක්මවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දුනිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත් වූ සියළුම තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත්, වසර 02 සිට වසර 07 දක්වා කාලයක් පැවති රු.2,205,095 ක ටෙන්ඩර් තැන්පතු සහ රු.410,750 ක ශාරීරික අධ්‍යාපන ඒකකයෙහි ආපසු ගෙවිය යුතු තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම තැන්පතු ජර්නල් සටහන් අංක JE/REV/2020/01 යටතේ ආදායමට ගැනීමට කටයුතු කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත කාලය තුළ කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදනකොමිෂන් සභා චක්‍රලේඛය (i) 2 වන වගන්තිය | සියලුම ස්වයං මූල්‍ය උත්පාදිත (Self-Financing Activities) ක්‍රියාකාරකම් ප්‍රතිපත්තියක් ලෙස වියදම් ආවරණය කර ගැනීමේ පදනම (Cost Recovery) සහ ලාභ ඉපැයීම අරමුණු කර නොගත් (Non Profited Basis) පදනම මත ක්‍රියාත්මක කළ යුතු වුවත්, ක්‍රියාකාරකම 13 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.52,158,154 ක ශුද්ධ මූල්‍ය (ගෙවීම් ඉක්මවූ ලැබීම්) අතිරික්තයක් ලබා තිබුණි. | මෙම ක්‍රියාකාරකම් ස්වයං මූල්‍ය උත්පාදිත ක්‍රියාකාරකම් ලෙස ක්‍රියාත්මක වී නොමැති අතර ඊට අදාළ රු.52,158,154 ක ශුද්ධ මූල්‍ය ප්‍රතිඵලය සම්බන්ධයෙන් සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | ස්වයං මූල්‍ය උත්පාදිත ක්‍රියාකාරකම් නොවන කිසිදු කටයුත්තක් විශ්වවිද්‍යාල අරමුදලට පරිබාහිරව පවත්වා ගත නොහැකිය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 5 වන වගන්තිය | ස්වයං මූල්‍ය උත්පාදිත (Self-Financing Activities) ක්‍රියාකාරකම් 16 ක් මඟින් සංවර්ධන වැය විෂයන් සඳහා (Development Vote) සිදු කළ යුතු අවම දායකත්වය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පාලක සභාව විසින් තීරණය කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර නොතිබුණු නිසා චක්‍රලේඛය ප්‍රකාරව සංවර්ධන වැය විෂයන් සඳහා මෙම ක්‍රියාකාරකම් මඟින් සිදුකර ඇති දායකත්වය අනාවරණය කර ගැනීමට නොහැකි විය. | ක්‍රියාකාරකම් 03 ක වර්ෂය අවසානයට ශේෂයන් නොමැති අතර ඉතිරි ක්‍රියාකාරකම් 13 ස්වයං මූල්‍ය උත්පාදිත ක්‍රියාකාරකම් මඟින් සංවර්ධන වැය විෂයන්ට දායකත්වය ලබාදී නොමැති බව සහ ඉදිරියේදී මේ පිළිබඳව සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | ස්වයං මූල්‍ය උත්පාදිත ක්‍රියාකාරකම් අදාළ චක්‍රලේඛයට අනුකූලව පවත්වා ගත යුතුය. |
| (ඉ) | ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක ජා.ගො.ප.ස. හා 2011 පෙබරවාරි 28 දිනැති 2011/01 චක්‍රලේඛය | විශ්වවිද්‍යාලය විසින් 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ක්‍රියාත්මක කර ඇති වටිනාකම රු.3,133,688,743 ක් වූ සුළු හා මධ්‍යම පරිමාණ ඉදිකිරීම් 22 ක් සම්බන්ධයෙන් ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ යෝග්‍යතා සහතික ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී සියලුම ඉදිකිරීම් සඳහා මෙම වාර්තාව ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ඉදිකිරීම් අදාළ චක්‍රලේඛ ප්‍රකාරව සිදු කළ යුතුය. |
| (ඊ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහය - 2006 3.10.1 පරිච්ඡේදයේ (අ) සහ (ආ) වගන්ති | විශේෂ ස්වභාවයේ වැඩ සඳහා වූ කොන්ත්‍රාත් සඳහා පමණක් නිර්මාණය කර ඉදිකිරීමේ (Design and Build) ප්‍රසම්පාදන ක්‍රමය යොදාගත යුතු බව දක්වා ඇතත්, විශ්වවිද්‍යාලය විසින් 2014 සිට 2018 දක්වා කාල පරිච්ඡේදයේදී වටිනාකම රු.2,052,814,016 ක් වූ සුළු හා මධ්‍යම පරිමාණයේ ගොඩනැගිලි ඉදිකිරීම් 11 ක් සඳහා යථෝක්ත ප්‍රසම්පාදන ක්‍රමය ක්‍රියාත්මක කර තිබුණ ද ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලබාගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘති 11 විශාල සංකීර්ණ කොන්ත්‍රාත්තු වන අතර ඒවා නිර්මාණශීලි ප්‍රවේශයන් සිදුකර ගැනීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. | මෙම ප්‍රසම්පාදන ක්‍රමය සඳහා කැබිනට් මණ්ඩලයේ විශේෂ අනුමැතිය ලබාගත යුතුය. |
| (උ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23(උ) වගන්තිය | විශ්වවිද්‍යාල භූමියේ පිහිටා ඇති සිසුන් 600 කට වැඩි ප්‍රමාණයකට නේවාසික පහසුකම් සපයනු ලබන, හිල්ඩා ඔබේසේකර නේවාසිකාගාරයේ ශාස්ත්‍ර පීය, විද්‍යා පීයවල පිහිටා ඇති ආපනශාලාවල අපජලය සෘජුවම මහවැලි ගඟට එකතු වෙමින් පැවතුණි. | මේ වන විට හිල්ඩා ඔබේසේකර නේවාසිකාගාරයේ ආපනශාලාවේ අපජලය බැහැර කිරීම සම්බන්ධ පද්ධතිය ඉදිකරමින් පවතින අතර ශාස්ත්‍ර පීය හා විද්‍යා පීයවල ආපනශාලාවල අපද්‍රව්‍ය බැහැර කිරීම් පද්ධති ඉදිරියේදී ආරම්භ කිරීමට කටයුතු කරමි. | අපද්‍රව්‍ය බැහැර කිරීම් කටයුතු අදාළ පාරිසරික නියමයන්ට යටත්ව සිදු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 8.2.2 ඡේදය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | සියලුම අතිරික්ත මුදල්, මුදල් ඇමතිවරයාගේ පූර්ව අනුමැතිය මත ආයෝජනය කළ යුතු වුවත්, විශ්වවිද්‍යාලය මඟින් සමාලෝචිත වර්ෂයේ රු.203,218,324 ක මුදලක් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | 2019 වර්ෂයේ ආරම්භ කරන ලද ස්ථාවර තැන්පතු සඳහා මුදල් ඇමතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමට යොමුකර ඇත. | අදාළ චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. |
| (එ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8 වන පරිච්ඡේදයේ 11 වන වගන්තිය | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කොන්ත්‍රාත් පැහැරහැර ඇති කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙක් අසාදු ලේඛන ගත කිරීමකින් තොරව නැවත නැවතත් කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. | මෙම කොන්ත්‍රාත්කරුවන් දෙදෙනාට ඔවුන් විසින් ආරම්භ කර තිබූ ඉදිකිරීම් ව්‍යාපෘති 03 සඳහා අවසන් බිල්පත් ඉදිරිපත් කර ඇත. ඒ අනුව එම කොන්ත්‍රාත්කරුවන් විසින් කොන්ත්‍රාත් කාර්යයෙහි පැහැර හැර නොමැති බවට සඳහන් කළ හැකිය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අදාළ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ඒ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XIII වන කොටසේ 99(1) වගන්තිය | භාණ්ඩාගාර අරමුදල් උපයෝජනය කර අරමුදල් 13 ක් පවත්වාගෙන යනු ලබන අතර 2019 දෙසැම්බර් 31 දිනට අරමුදල් ගිණුම්වල රු.48,462,976 ක ශේෂයක් පැවතුණි. | මෙම ගිණුම් භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් පරිබාහිරව පවත්වාගෙන යනු ලබන ගිණුම් නොවන අතර මූලික වශයෙන් වෙනත් ලැබීම් ආදායම් ප්‍රභවය වශයෙන් ලබාගෙන පීය මට්ටමින් ස්ථාපිත කරන ලද ලෙජර් ගිණුම් වේ. | මෙම අරමුදල් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පනතේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ඓ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XIII වන පරිච්ඡේදයේ 99(I)(ඇ) වගන්තිය | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරයා විසින් විශ්වවිද්‍යාලීය ක්‍රීඩා සංගමය (Sport Council of the University of Peradeniya) නමින් විශ්වවිද්‍යාලය තුළ ඇති මහජන බැංකු ශාඛාවේ 2016 පෙබරවාරි 18 දින ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කර එදින සිට විගණන දිනය වූ 2019 ජූලි 05 දක්වා කාලය තුළ රු.3,250,115.50 ක මුදලක් බැර කර තිබූ අතර එම මුදල විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීමකින් තොරව අයථා ලෙස පරිහරණය කර තිබූ බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව විමර්ශනයන් පවත්වා අවසන්ව ඇති අතර එහි වාර්තා 2020 ජූලි මස පැවැත්වෙන පාලක සභාවට ඉදිරිපත් කිරීමට නියමිත අතර ඒ අනුව අදාළ පුද්ගලයන්ට එරෙහිව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. | මෙවැනි තත්ත්වයන් නැවත ඇති වීම වැළැක්වීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමය වැඩි දියුණු කිරීමට හා විමර්ශන වාර්තාවට අනුව අදාළ පුද්ගලයන්ට එරෙහිව කඩිනමින් පියවර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.1,788,913,770 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.632,788,598 ක ඌනතාවයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,156,125,172 ක අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම අඩුවීමට මහපොළ ආධාර සඳහා ලැබුණු මුදල් අඩුවීම, විභාග ගාස්තු ආදායම අඩුවීම, පෞද්ගලික පඩිනඩි වියදම වැඩිවීම, සැපයුම් සේවා වියදම වැඩිවීම, ගිවිසුම් සේවා වියදම වැඩිවීම හා ක්ෂයවීම් වියදම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 වර්ෂයේ පමණක් අතිරික්තයක් ඇතිවී තිබූ අතර, අනෙකුත් සෑම වර්ෂයකම ඌනතාවයක් ඇති වී තිබුණි. එමෙන්ම 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවය සියයට 182 කින් වැඩිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය යටතේ ක්‍රියාත්මක වන ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානය මඟින් පසුගිය වසර 03 තුළ බාහිර පාර්ශවයන් 07 දෙනෙකු වෙත ඉදිකිරීම් සම්බන්ධව උපදේශන සේවාවන් ලබාදී ඇතත්, විශ්වවිද්‍යාල ඉදිකිරීම් ව්‍යාපෘති 11 ක් සඳහා උපදේශන සේවාවන් බාහිර පාර්ශවයන්ගෙන් ලබාගෙන ඒ සඳහා රු.93,829,364 ක් ගෙවීමට විශ්වවිද්‍යාලය ගිවිසගෙන තිබුණි. | ඉදිරි කොන්ත්‍රාත් සිදු කිරීමේදී උපදේශන සේවා ඉංජිනේරු පීඨයේ නිර්මාණ මධ්‍යස්ථානයෙන් තරඟකාරී ක්‍රමය යටතේ ලබා ගැනීමට කටයුතු කළ හැකිය. | විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානයෙන් උපදේශන සේවා ලබා ගැනීමට විධිමත් ක්‍රමවේදයන් හඳුන්වාදීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල ඇස්තමේන්තුගත වටිනාකම රු.68,270,171 ක්වූ පුනරුත්ථාපන ව්‍යාපෘති 37 කට අදාළව මූලික කටයුතු සිදුකර කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්වලට එළඹ හෝ කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදාන ලිපි (Awarding Letters) ලබාදී තිබියදී ක්‍රියාත්මක නොකර අතහැර දමා තිබුණි. | ඇස්තමේන්තු සංශෝධනය, නැවත සකස් කිරීම, ප්‍රධානීන්ගේ අවශ්‍යතා නිතර වෙනස් වීම, ශිෂ්‍ය උද්ඝෝෂණ, වැඩ වර්ජන හා භූමිය කොන්ත්‍රාත්කරු වෙත නිදහස් නොකිරීම වැනි හේතු මත කොන්ත්‍රාත් ප්‍රදානය ප්‍රමාදවීම හේතුවෙන් මිල විචලනයන් සිදුවීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වන අවස්ථා ඇත. | සැලසුම් සහිතව කර්මාන්තය ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ නිලධාරියකු වෙනුවෙන් 2010 මාර්තු සිට 2014 පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් නොගෙවීම හේතුවෙන් රු.142,600 ක අධිභාර මුදලක් විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවා තිබුණි. | මේ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුව 2020 ජූලි 22 දින රැස්වීමට නියමිත බැවින් ඉන් අනතුරුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට සිදු කිරීමටත්, අදාළ සිද්ධිය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විශ්වවිද්‍යාලය සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ලබාදී තිබූ නේවාසිකාගාර 06 ක මුල් ඉදිකිරීමේදී නිලධාරීන්ගේ ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු නොවීම, සීමාව ඉක්මවා නේවාසිකාගාර සඳහා සිසුන් ඇතුළත් කිරීමට තීරණය කිරීම හා පවතින විදුලි පද්ධති පිළිබඳ නිසි ඇගයීමක් සිදු නොකිරීම යන කරුණු නිසා රු.14,736,760 ක වියදමක් දරමින් විදුලි පද්ධතිය නැවත ස්ථාපිත කිරීමට සිදුවී තිබුණි. | මෙම නේවාසිකාගාරවල සැලසුම් හා තාක්ෂණික ඇගයීම් සියල්ල සිදු කරනු ලැබුවේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් වන අතර අධීක්ෂණ කටයුතු පමණක් සිදු කරන ලදී. මුලදී එක් කාමරයකට සිසුන් දෙදෙනෙකු ඇතුළත් කිරීමට සැලසුම් කර තිබුණ නමුත් පසුව නේවාසික ශිෂ්‍ය සංඛ්‍යාව දෙගුණ කිරීමට තීරණය කිරීම නිසා විදුලි පද්ධතියේ ද ධාරිතාවය දෙගුණ කිරීමට සිදුවන ලදි. | විශ්වවිද්‍යාලය තුළ සිදු කරනු ලබන සියළුම ඉදිකිරීම් ප්‍රමාණවත් ඇගයීමක් හා අධීක්ෂණයක් මඟින් පමණක් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතුව පවතින පර්චස් 25 ක් වන ඉඩම් කොටසක් 1997 වර්ෂයේ සිට විගණන දිනය වන 2020 ජූනි දක්වා ගඟවටකෝරලේ ප්‍රාදේශීය සභාව විසින් භුක්ති විඳිමින් සිටිය ද එම දේපළ සම්බන්ධයෙන් කිසිදු බදු මුදලක් අය කර ගැනීමට හෝ එකී දේපළ විශ්වවිද්‍යාලයට නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම සඳහා 1997 වර්ෂයෙන් පසු ප්‍රාදේශීය සභාව මඟින් ගිවිසුමකට එළඹ නොමැත. එහෙත් මෑතකදී ප්‍රාදේශීය සභාව ඉඩමට අනවසරයෙන් ඇතුළු වී ඒ තුළ අනවසර වෙළඳ කුටි ඉදිකිරීමට කටයුතු කර ඇති අතර එයට විරුද්ධව මහනුවර මහාධිකරණයේ නඩු පවරා ඇත. | විශ්වවිද්‍යාලයට අයත් බාහිර පාර්ශවයන් විසින් අවිධිමත් ලෙස භුක්තිවිඳින දේපළ කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2017 වර්ෂයේ අනුමත කාර්යමණ්ඩල විස්තරය අනුව අනුමත වැඩ සහායකයින් 635 දෙනෙකු අතුරින් වැඩ සහායකයින් 614 ක් බඳවාගෙන විශ්වවිද්‍යාලයේ වැඩ ඒකක 125 ක් වෙත අනුයුක්ත කර ඔවුන් වෙත අතිකාල පැය 8797 ක් අනුමත කර තිබුණ ද 2019 වර්ෂයේ විශ්වවිද්‍යාලය විසින් පුද්ගලික අංශයේ සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ කටයුතු සඳහා පුද්ගලයින් 375 කගේ සේවය ලබා ගැනීම වෙනුවෙන් රු.116,349,252 ක් වටිනා ගිවිසුම්වලට එළඹ තිබුණි. අනුමත ස්ථිර වැඩ සහායක | 2019 වර්ෂයේදී පුද්ගලික අංශයෙන් ලබාගන්නා ලද පවිත්‍රතා සේවාවන් සියයට 20 කින් අඩු කරන ලද අතර 2020 වර්ෂයේ සිට ශිෂ්‍ය නේවාසිකාගාර 07 කට හැර පවිත්‍රතා සේවාවන් ලබා නොදීමට කටයුතු කරන ලදී. එසේම දැනට සේවය කරන වැඩ සහායක මහත්ම මහත්මීන්ගේ රැකියා විස්තරයට එම රාජකාරී ඇතුළත් කරන ලෙසට සියලුම පීඨාධිපතිවරුන් හා අංශ ප්‍රධානීන් වෙත දන්වා සිටින ලදී. | වැඩ සහායකයන්ට නිශ්චිත පරිදි රාජකාරී පැවරීම සහ ඔවුන්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාර්යමණ්ඩලය වෙත විධිමත් පරිදි රාජකාරී පැවරීමක් නොකිරීම, සේවක අනුයුක්ත කිරීම්වල විෂමතා පැවතීම වැනි දුර්වලතා හේතුවෙන් පෞද්ගලික අංශයේ සේවාවන් ලබා ගැනීමට සිදුවී තිබුණි. | | |
| (ඇ) | විශ්වවිද්‍යාලයට අයත් පිඹුරු අංක 1972 දරන ඉඩමෙහි කැබලි කොටස් 04 ක් 1987 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා වූ වසර 30 ක කාලයකට උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවට බදු දී තිබුණ ද එම කාලපරිච්ඡේදය වෙනුවෙන් අයවිය යුතු රු.6,590,000 ක බදු මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට හා ගිවිසුම් කාලය ඉක්මවී ඇති ඉඩමේ භුක්තිය පවරා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | 2016 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයට අයවිය යුතු රු.6,580,000 ක බදු මුදල ගෙවීම පැහැර හැර ඇත. මේ වන විට එම ගොඩනැගිලි සංකීර්ණයේ ගොඩනැගිලිවලින් භාගයක ප්‍රමාණයක් විශ්වවිද්‍යාලය වෙත නිදහස් කර ඇති අතර මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ ඉඩම් හා ගොඩනැගිලි කමිටුව විසින් අවශ්‍ය නිතීමය කටයුතු සඳහා යොමු කිරීමට අනුමැතිය ලබා දී ඇත. | අය කරගත යුතු බදු මුදල් කඩිනමින් අයකර ගැනීමට හා ඉඩමේ භුක්තිය පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා නවක සිසුන් බඳවා ගැනීමෙන් පසු ක්‍රියාත්මක කර තිබූ ආරක්ෂක වැඩ පිළිවෙළ සඳහා පාලන ක්‍රමවේදයන් හඳුන්වාදීමෙන් තොරව දිනකට රු.7,000 ක මුදලට මාස 03 ක කාලයක් වෙනුවෙන් පෞද්ගලික අංශයෙන් වාහනයක් ලබා ගෙන ඒ සඳහා රු.469,000 ක මුදලක් ගෙවා තිබුණි. විශ්වවිද්‍යාලයේ වාහන පැවති අවස්ථාවලදී හා විශ්වවිද්‍යාලයේ වාහන භාවිතා කර තිබූ අවස්ථාවලදී ද මෙම වාහනය වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. | දිනකට රු.7,000 ක් ගෙවා කුලී රථ මිලදී ගැනීම ඵලදායී නොවන බව පිළිගන්නා අතර ඉදිරියේදී මෙම රාජකාරී කටයුතු සඳහා විශ්වවිද්‍යාලයේ වාහන ලබා ගැනීමට කටයුතු කරමි. තවද පෙන්වා දී ඇති පරිදි සති අන්ත දිනවලදී වාහන රථගාලේ ගාල්කර තිබුණේ රියදුරන් නොමැති වීම හේතුවෙනි. | රජයේ අරමුදල් කාර්යක්ෂමව හා පිරිමැසුම්දායක ලෙස භාවිතා කිරීමට නිලධාරීන්ගේ අවධානය යොමු විය යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ ආචාරධර්ම හා අධ්‍යයන වගවීම පිළිබඳ මාර්ගෝපදේශයේ 05 වන වගන්තියට පටහැනිව විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය පීඨයේ හිටපු පීඨාධිපතිවරයෙකු විසින් තම දියණිය සඳහා M.Phi උපාධිය පිරිනැමීමේදී එහි පරීක්ෂණ කටයුතු හා විභාග කටයුතු ඔහු විසින් අධීක්ෂණය කර | ද්විත්ව සම්බන්ධතා හඳුනා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර මින් ඉදිරියට එවැනි සම්බන්ධතාවයන් පිළිබඳ කරුණු අනාවරණය වුවහොත් අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය පශ්චාත් උපාධි අපේක්ෂක අත්පොතට හා අතුරු ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇත. | අදාළ මාර්ගෝපදේශය අනුව කටයුතු කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සැකසීම හා මෙම සිද්ධියට අදාළ ඉදිරි පියවර කඩිනමින් ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2016 ජූලි 12 දින අදාළ උපාධිය පිරිනැමීමට කටයුතු කර තිබුණි. | | |
| (ආ) | ගිවිසුම් කඩකර අවුරුදු 15 - 30 ක කාලයක් ඉක්මවා ඇති ආචාර්යවරුන් 62 ක ගෙන් අයවිය යුතු රු.23,347,468 ක මුදලක් එකී ආචාර්යවරුන් සමඟ කිසිදු ලිපි ගනුදෙනුවක් කිරීමට නොහැකි වීම සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ද නොහැකි වීම හේතුවෙන් විශ්වවිද්‍යාල පාලක සභාව විසින් පත් කළ උප කමිටුව විසින් (Sub Committee) අයකර ගත නොහැකි ලෙස සලකා පොත්වලින් ලියා හැරීමට නිර්දේශ කර තිබුණි. | මෙම බැදුම්කර ඉතා පැරණි වන අතර මේ වන විට එම බැදුම්කර අයකර ගැනීමට විකල්ප මාර්ගයන් නොමැති වී ඇත. එම තත්ත්වය මත මෙම බැදුම්කර වටිනාකම් මුදල් රෙගුලාසි ප්‍රකාරව පොත්වලින් කපා හැරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශය හරහා කමිටුවක් පත් කිරීමට කටයුතු කරමින් සිටි. | ගිවිසුම් කඩ කරන ලද ආචාර්යවරුන්ගේ අය විය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් හඳුන්වාදිය යුතුය. |

**3.4** **අරමුදල් ඌන උපයෝජනය**

**----------------------------**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින හා සමාලෝචිත වර්ෂයේදී ප්‍රමාණවත් ගනුදෙනු සිදු නොවුණු වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.47,160,650 ක් වූ ස්වයං මූල්‍ය උත්පාදිත (Self-Financing Activities) අරමුදල් 32 ක් ඌන උපයෝජිතව පැවතුණි. | සමාලෝචිත වර්ෂය තුළ ප්‍රමාණවත් ගනුදෙනු සිදු නොවූ ක්‍රියාකාරකම් පැවතිය ද මෙම ක්‍රියාකාරකම්වලට අදාළව ශේෂයන් ඉදිරියේදී අදාළ අරමුණුගත කාර්යයන් සඳහා යෙදවීමට අපේක්ෂිත බැවින් තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ. | ඌන උපයෝජිතව පවතින ස්වයං මූල්‍ය උත්පාදිත අරමුදල් කඩිනමින් උපයෝජනය කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පිය 09 ක ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගෙන් අයකරන මුදල් ආයෝජනය මඟින් ලැබෙන පොලී ආදායම උපයෝගී කර ගෙන පවත්වාගෙන යන අරමුදල් ගිණුම් 09 ක එකතුව රු.39,460,912 කින් සමාලෝචිත වර්ෂයේ අරමුදල් 07 ක් මඟින් කිසිදු වියදමක් දරා නොතිබීම නිසා එම අරමුදල් ඌන උපයෝජිතව පැවතුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 737 සඳහන් කාර්යයන්ට අමතර වෙනත් කාර්යයන් සඳහා මුදල් වැය කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට 2019 ජූනි 21 දිනැති ලිපිය මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමෙන් ඉල්ලීම් කර ඇත. | ඌන උපයෝජිතව පවතින අරමුදල් උපයෝජනය කර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් හඳුන්වාදිය යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාලයේ සත්ත්ව විද්‍යා දෙපාර්තමේන්තුව සඳහා ඇතුළත් කර ගන්නා සිසුන් වැඩිකර ගැනීමේ අරමුණ ඇතිව 2017 වර්ෂයේ රු.916,874,697 ක වියදමින් ඉදිකර තිබූ ගොඩනැගිල්ල තුළ සිසුන් 350 ක හා 250 ක ප්‍රමාණයකට අසුන්ගත හැකි දේශනශාලා 02 ක් සඳහා අවශ්‍ය ලී බඩු හා උපකරණ නොමැති වීම හේතුවෙන් වසර 03 ක කාලයක් නිෂ්කාර්යව පැවතුණි. එසේම අනුමත සිසුන් 50 ක ප්‍රමාණයවත් ඇතුළත් කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් ගොඩනැගිල්ලේ අනෙකුත් කොටස්ද ඌන උපයෝජිතව පැවති අතර විධිමත් ඇගයීමකින් තොරව ගොඩනැගිල්ල ඉදිකිරීම ඒ සඳහා හේතුවී තිබුණි. | පාඨමාලාව ඉල්ලීම හා අවශ්‍යතාවය මත මෙම ගොඩනැගිල්ල ඉදිකර ඇත. මෙම ගොඩනැගිල්ලේ විශාල ශාලා 02 කින් එකක් මේ වන විටත් පාඨමාලා සඳහා භාවිතා කරන අතර පුටු 300 ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුවට යොමු කර ඇත. තවද ලී බඩු සඳහා ඉල්ලීම් කළද ඒ සඳහා ප්‍රතිපාදන නොලැබීම මත මිලදී ගැනීමට නොහැකි වී ඇත. | ගොඩනැගිලි ඉදිකිරීමේදී විධිමත් ඇගයීමක් සහිතව ඉදිකිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම වෙනුවෙන් 2015 දෙසැම්බර් 15 දින රු.3,500,000 ක මුදලකට බාහිර පාර්ශවයක් සමග ගිවිසුම්ගත වී ඉන් රු.740,000 ක මුදලක් ගෙවා වසර 03 ක කාලයක් ගතවී ඇති නමුත් අදාළ මුදල ලබා ගැනීමට හෝ එම කාර්යය ඉටුකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් 2019 නොවැම්බර් 01 දින රැස්වූ විශ්වවිද්‍යාල පාලක සභාව අනුව 2020 පෙබරවාරි 06 දින අදාළ ආයතනය සමඟ පවත්වන ලද සාකච්ඡාව අනුව මෙම තොරතුරු පද්ධතිය නැවත සාදා නිම කිරීමට එකඟතාවය පළ කරන ලදී. මේ වන විට එහි කටයුතු සිදු වෙමින් පවතී. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | විශ්වවිද්‍යාලයේ වැඩ දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය තුළදී වටිනාකම රු.2,762,449,213 ක් වූ සුළු හා මධ්‍යම පරිමාණයේ ප්‍රාග්ධන ව්‍යාපෘති 18 ක් සහ වටිනාකම රු.1,339,926,823 ක් වූ පුනරුත්තාපන ව්‍යාපෘතීන් 70 කින් | වැඩ දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්මික නිලධාරීන් දෙදෙනෙකු සහ වැඩ පරිපාලකවරයෙකු සඳහා ද පුරප්පාඩු පවතී. ඉදිරියේදී නිලධාරීන් බඳවා ගැනීමට නියමිත | ඉදිකිරීම් කර්මාන්තවල අධීක්ෂණය ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමන්විත එකතුව රු.4,102,376,036 ක් වූ ව්‍යාපෘතීන් 88 ක් ක්‍රියාත්මක කරමින් පැවතුණි. නමුත් ඒ සඳහා වැඩ දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත තාක්ෂණික කාර්යමණ්ඩලය 14 දෙනෙකු පමණක් වීමෙන් එම කර්මාන්තවල අධීක්ෂණය ප්‍රමාණවත් මට්ටමකින් සිදුකළ නොහැකි වී තිබුණි. | අතර ඉන් පසුව සියලුම කාර්යයන් ක්‍රමවත්ව පවත්වාගෙන යාමට හැකියාව පවතී. | |
| (ආ) | විස්තරාත්මක පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමකින් තොරව විශ්වවිද්‍යාලයේ වැඩ දෙපාර්තමේන්තුව 2019 ජූනි මාසය දක්වා මාස 06 ක කාලය තුළ රු.57,004,881 ක් වටිනා වැඩ (Direct Labor) 1572 ක් ක්‍රියාත්මක කර තිබුණි. | දැනට පවතින මානව හා භෞතික සම්පත් උපයෝගී කරගෙන රු.50,000 ට වැඩි නඩත්තු කටයුතු සඳහා පමණක් පූර්ව පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කරගෙන යනු ලැබේ. | විස්තරාත්මක ඇස්තමේන්තු සහිතව පමණක් ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 ජනවාරි 25 දින වන විට වටිනාකම රු.944,826,576 ක් වූ ඉදිකිරීම් ව්‍යාපෘති 12 ක් සැලසුම් කළ පරිදි වැඩ නිම කරවා ගැනීමට නොහැකි වීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතයට ගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘතිවල පැවති විවිධ ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් භාවිතා කිරීමට නොහැකි විය. ඉදිරියේදී භාවිතා කිරීමට කටයුතු කරමි. | ඉදිකිරීම් ව්‍යාපෘති සැලසුම්වලට අනුව නියමිත කාලය තුළ අවසන් කර ගැනීමට හා අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු විය යුතුය. |

**3.8 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 9.10 වගන්තිය පරිදි විශ්වවිද්‍යාලයේ අනුමත කාර්යමණ්ඩලයේ පවතින විශේෂඥ ගණයට අයත් නොවන පුරප්පාඩු 279 ක් පිරවීමට හෝ අහෝසි කර දැමීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | අනුමත කාර්යමණ්ඩල වාර්තාවේ පවතින තොරතුරු අතරින් 2020 ජූනි 01 දිනට පවතින පුරප්පාඩු එකතුව 229 කි. අනධ්‍යයන සේවක වර්ජන, මැතිවරණය ප්‍රකාශයට පත් කිරීම හා කොරෝනා වසංගත තත්ත්වය මත දිගින් දිගටම බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වන ලදී. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලය අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩුව පවතින ව්‍යාපෘති කළමනාකරු, විදුලි ඉංජිනේරු සහ ජීවිතාරක්ෂක (පිහිනුම් තටාක) යන තනතුරු සඳහා 2020 ජූනි වන විටත් ස්ථිර නිලධාරින් බඳවා ගැනීමට කටයුතු නොකර පිළිවෙළින් වසර 04 ක්, වසර 02 ක් හා වසර 01 ක කාලසීමාවක් කොන්ත්‍රාත් පදනම මත නිලධාරින් සේවයේ යොදවා තිබුණි. | ජීවිතාරක්ෂක පිහිනුම් තටාක තනතුර 2017 අනුමත තනතුරු ලේඛනය අනුව කොන්ත්‍රාත් තනතුරක් ලෙසට අනුමත වී ඇති නිසා ස්ථිර සේවකයෙකු බඳවා ගැනීමට නොහැක. එසේම ව්‍යාපෘති කළමනාකරු තනතුර සඳහන් සුදුසු පුද්ගලයන් නොසිටි බැවින් 2016 මැයි 02 දින සිට | අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු වූ තනතුරු කඩිනමින් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවාගෙන ඇති අතර විදුලි ඉංජිනේරු තනතුරු 2017 වර්ෂයේ අනුමත වුවත්, බඳවාගැනීමේ පරිපාටියක් අනුමතවී නොමැති බැවින් මේ වන විට ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.